දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ED/01/05/05/07/11

දිනය / திகதி / Date } 2018.01.17

චක්‍රලේඛ අංක :- **02/2018**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සමාජ විද්‍යා විෂය අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම විදුහල්පතිවරුන්,
සියලු ම සමාජ විද්‍යා පිළිබඳ ගුරු උපදේශකවරුන්,

<u>පාසල්, කලාප, පළාත්, සමස්ත ලංකා හා ජාතික මට්ටමේ සමාජ විද්‍යා තරගාවලිය පැවැත්වීම සඳහා වන චක්‍රලේඛය සංශෝධනය</u>

අධ්‍යාපන ලේකම් ගේ අංක 2012/ 20 හා 2012/07/10 දිනැති සමාජ විද්‍යා චක්‍රලේඛය 2018/01/01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් සංශෝධනය කරමි.

ඒ අනුව පාසල් මට්ටමේ සමාජ විද්‍යා වාර්ෂික තරගාවලියට අදාළ මෙම චක්‍රලේඛ විධිවිධාන සමඟින් ඊට අමුණා ඉදිරිපත් කර ඇති උපදෙස් සංග්‍රහය අනුව මෙම තරගාවලිය පැවැත්විය යුතු අතර මෙම චක්‍රලේඛ විධිවිධාන 2018-01-01 දින සිට බලාත්මක වන බව විශේෂයෙන් දන්වමි.

පළාත්, කලාප, කොට්ඨාස, පාසල් මට්ටම නිසි පරිදි දැනුවත් කරමින් 2018 වර්ෂයේ සිට වාර්ෂිකව මෙම තරගාවලිය ඒ ඒ මට්ටම්වලින් පැවැත්වීමටත් ඉන් අනතුරුව ජාතික මට්ටම හා සමස්ත ලංකා මට්ටමින් ජයග්‍රාහක සිසු සිසුවියන් තෝරා ගැනීමටත් විශේෂයෙන් කටයුතු කළ යුතු වේ.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය